


# පුදුම හමුවීමක කතාන්තරය

**ජ**පානයේ එදෝ යුගයේ දී ඈත ගමක පදිංචිව සිටි ජපන් ගොවි පවුලක ඉචිරෝ හා ජිරෝ නමින් සහෝදරයෝ දෙදෙනෙක් වූහ. ඉචිරෝ අයියාය. ජිරෝ මල්ලීය. අයියා වන ඉචිරෝ මුරණ්ඩු දඩබ්බරයෙකු විය. මල්ලී ජිරෝ, සන්සුන් ගති ඇති යහපත් අයෙකි. වයසින් වැඩෙත්ම මහන්සි වී වැඩකරන්නට අකමැති වූ ඉචිරෝ ගෙදරින් පැන ගියේ ය.

කලකට පසු ඔවුන්ගේ පියා අසනීපව මියගියේය. නිවසේ සියළුම බර ජිරෝ වෙත පැවරුණි. සිය මෑණියන්ද රැකගෙන, ජීවත්වීමට සෑහෙන ආදායමක් ද නොමැති වූයෙන් කුඹුරෙන් කොටසක් විකුණා ටික කලක් ජීවත් වුවත් එයද අවසන් වීගෙන ආයේ ය. පරම්පරාගත ඉඩමෙන් කොටසක් විකුණන්නට සිදුවීම ගැන දැඩි පසුතැවිල්ලට පත් ජිරෝ අම්මාගෙන් අවසර ලබාගෙන මුදල් සෙවීම සඳහා අගනුවර වන එදෝ වෙත ගියේ ය. එවිට ඔහුගේ වයස අවුරුදු 16 කි.


නගරයේ වෛද්‍යවරයෙකු ළඟ සේවය කළ ජිරෝට සෑහෙන මුදලක් හම්බකර ගැන්මට හැකිවිය. ජිරෝ තම අතීත කතාව වෛද්‍යවරයාට පවසා තමාගේ අදිටන කුඹුර ද බේරාගෙන අම්මාට සැපවත් ජීවිතයක් සළසන්නට බව කීය. ඒ ගැන පැහැදුණු වෛද්‍යවරයා ඔහුට තවත් සෑහෙන මුදලක්ද දී රැකියාවෙන් ඔහු නිදහස් කළේ ඒ සිහිනය සැබෑකර ගන්නට ය.

ජිරෝ ගම බලා පිටත් විය. එකල රථවාහන නොවූයෙන් ගමට පයින් යාමට ඔහුට දින ගණනක් ගතවන්නේය. අභාග්‍යයකි. එක්තරා කඳු මුදුනකදී ඔහු මංකොල්ලකරුවන්ට අසු විය. හොරු ඔහුගේ සියළුම මුදල් උදුරාගෙන ඇඳි වස්ත්‍රද උනා ගත්තෝ ය. ඇඳගෙන සිටි වස්ත්‍ර ද, වසර ගණනක් දුක් මහන්සිව උපයාගත් ධනයද සියල්ල අහිමිවීම ජිරෝට ඉමහත් සිත් තැවුලක් වීය. ඔහුට දැන් කර කියා ගන්නට දෙයක් නැත. අවසානයේ ජිරෝ තීරණයකට එළඹි, සොර දෙටුවාගේ දෙපා වැඳ ඉල්ලා සිටියේ ඔවුන් ළඟ දාසයෙකු මෙන් සේවය කරන්නට අවසර දෙන ලෙස ය. සොර දෙටුවා ජිරෝ වෙත අපහාසාත්මක බැල්මක් හෙලමින් මඳක් කල්පනා කර බලා "හා එහෙනම් වැඩ කරපං " යයි පිළිතුරු දුන්නේ ය.

දින තුනක් පමණ වැඩ කිරීමෙන් පසු ජිරෝ ට මෙම හොරුන්ගේ තිප්පොළ කොහෙත්ම ගැලපෙන තැනක් නොවන බව වැටහුනෙන් ඔහු හොර දෙටුවා හමුව තමාට ගමට ගොස් කිසියම් රැකියාවක් කර ජීවත්වීම අවශ්‍ය බව පැවසී ය. එසේම ආපසු යාමේදී වන සිව්පාවුන්ගෙන් බේරීම සඳහා තමන් රැගෙන ආ කඩුව පමණක් ආපසු දෙන්නැයි ඉල්ලා සිටියේ ය. සොරකම් කළ දෑ ආපසු දීම සොරුන්ගේ සිරිත නොවන බැව් පැවසූ හොරදෙටුවා "උඹේ කඩුව ආපහු දෙන්න බෑ, ඕන නම් වෙන කඩුවක් තියනවා ඒක අරගෙන පලයං" යයි පිළිතුරු දුන්නේය.

පැරණි මළකඩ කෑ කඩුවක් තමාගේ ආරක්ෂාවට ලබාගත් ජිරෝ එදෝ නගරයට පැමිණ අර පරණ වෛද්‍යවරයා හමුවුණේ යළිත් එතැන රැකියාවක් ලබා ගන්න හැකිදැයි සොයා බලන්නට ය. හොරු මුදල් පැහැරගැනීමේ සිද්ධියේ සිට පරණ කඩුවක් ආරක්ෂාවට ඉල්ලාගැනීම දක්වා සියළු විස්තර පැවසූ විට වෛද්‍යවරයා ඒ කඩුව පිරික්සා බලන්නට අවශ්‍ය බව කීය.

ඔහු කඩු ගැන තරමක විශේෂඥයෙකි. එය ඉතාම පැරණි වටිනා කඩුවක් වන අතර, එය ප්‍රසිද්ධ හා දක්ෂ නිමැවුම්කරුවෙකු නිමැවූවක් බව පැවසූ වෛද්‍යවරයා "නුඹ කැමති නම් රියෝ 30 කට මිළදී



චිත්‍රය - තලන්ගම

ගැනීමට සතුටු යයි කීවේය. ඒ සා විශාල මුදලක් ගැන විස්මිත වූ ජිරෝ ඊට කැමති වූයේ ඉක්මනින් ආපසු ගොස් විකුණූ කුඹුර ආපසු ලබාගෙන තම ආදරණීය මෑණියන් හා ජීවත්වීමට ඉන් ඉඩ ලැබෙන නිසා ය.

මුදල් ද රැගෙන ගමට යන ගමනේදී ජිරෝ එදා තමාගේ සියල්ල මංකොල්ලකෑ සොරුන් කණ්ඩායම හමුවීමට ගියේ සිය කැමැත්තෙන්මය. සොර දෙටුවා මුණගැසුණු ඔහු මෙසේ කීය. "ඔබෙන් ලබාගත් කඩුව මම රියෝ 30 කට විකුණුවා. එතරම් මුදලක් තනියම ගන්න මං කැමති නෑ. ඒ නිසා එයින් හරි අඩක් ඔබට දෙන්නයි මං ආවෙ." එය අසා තුෂ්ණිම්භූතවූ සොරු එකිනෙකාගේ මූණ බැලූහ.

ඉන්පසු සොර දෙටුවා "මේ වගේ අවංක මෝඩයෙක් හම්බවුණු මගේ ජීවිතේ පළමුවෙනි වතාව... උඹේ ගම කොහේද....? ඇත්තට කවුද දෙමව්පියෝ....? " කියා ඇසීය. ජිරෝ තම නම ගම ඇතුළු පවුලේ විස්තර කීවේය. ඒ ගැන මඳක් කල්පනාකරමින් සිටි සොරදෙටුවා.. "මට හිතුන හරි. එදා වගේම යහපත් වූ උඹ මගේ මල්ලී...." යයි පැවසීය.

වසර ගණනාවකට පෙර නිවසින් පිටව ආ අයියා ඉචිරෝ මෙම සොරදෙටුවා විය. "මම කුඩා සන්දියේදි ගෙදරින් ආව හන්දා මූණවත් මතක නෑ.... එකම පවුලක වෙලා උඹෙයි මගෙයි කොයි තරම් වෙනසක්ද? මම උඹේ අයියා ඉචිරෝ.." යයි පවසා "මං කරන නරක වැඩ බැලුවම උඹ වගේ අවංක මිනිහෙකුගෙ අයියයි කියන්නත් මට ලැජ්ජයි..."

ඔහු මල්ලී බදාගෙන ඉකිගසමින් හඬා වැළපුණේය. ජිරෝද තම අයියා හමුවීමේ සතුට මෙන්ම අඩන ඉචිරෝ දැක ඇඬුම් ආයෙන් ආයෙත් එකිනෙක් බදාගෙන හඬන්නට වූහ.

තමා සොරකමෙන් ඉවත්වී මල්ලී සමග ගමට යන බව අනෙක් පිරිසට පැවසූ ඉචිරෝ, ජිරෝ සමග පිටත්විය. තම මෑණියන් හමුව දෙපා වැඳ එතෙක් කළාවූ වැරදිවලට ඔහු සමාගත්තේය. ජිරෝ රැගෙන ගිය රියෝ 30 න් කුඹුර ආපසු මිළදීගෙන නිවහනක්ද තනවා තිදෙන සතුටින් විසූහ.

මල්ලී ජිරෝ, අයියා ඉචිරෝ හමුවී දිනක් මෙසේ කීවේය. "ඔබ අයියා නිසා ගෙදරයි කුඹුරෙයි අයිතිය ඔබටයි. අයියාගේ උදව්කරු විදියට කටයුතු කිරීම මට මහත් ප්‍රීතියක් "

" මල්ලී මම ගෙදරින් පැන ගිය මිනිහෙක්.... මේවායේ උරුමය ලබන්න මට කිසි අයිතියක් නැහැ... ජිරෝ ඔබ ඒ උරුමය බාරගන්න..."

එසේ පැවසූ ඉචිරෝ යළිත් ගෙදරින් පිටවිය. මෙවර ඔහු ගියේ පන්සල වෙතය. එහිදී හිස මුඩුකර පැවිදි බවට පත් ඔහු බණ දහම් වඩා ඉතිරි කාලය දැහැමෙන් ගත කළේය.

♦ **සිරි හේරත් - Editor - Tokyo Puwath**
**Machida Shi, Tokyo, Japan**

# රණවිරුවෙකු යුගදිවියට එළඹුණු දා

## මේජර් දුෂ්‍යන්ත යාපා සහ දර්ශනී ගන්ගොඩ





**ගි**ය ඔක්තෝබර් **1** වෙනි දින රණවිරු මේජර් දුශ්‍යන්ත යාපා මහතා සහ දර්ශණී ගන්ගොඩ මෙනවිය අතර විවාහ මංගල්‍යය අඹේපුස්ස යුද හමුදා කඳවුරේ, සිංහ බලකායේ නිලධාරි නිවස්නේදී ඉතා උත්කර්ශවත් අන්දමින් සිදුවිය. විශේෂ ආරාධිත අමුත්තා වූයේ ජෙනරාල් සරත් පොන්සේකා මහතාට පසු සිංහ රෙජමේන්තුවේ වත්මන් අණදෙන නිලධාරි වූ මේජර් ජෙනරාල් අරුණ ජයතිලක මහතාය. උදයේ **9.15** ට පෝරුවේ චාරිත්‍ර සිදුවිය. සියලුම සැරසිලි ද ආරාධනා පත්‍ර කේක් දැවටුම් ආදී සියළුම දේ කොළපැහැයෙන් වීම මෙහි පෙනුණු විශේෂයකි. මනාලයා ද මනාලියගේ යෙහෙළියන් ආදීන් ද සැරසී සිටියේ සිංහ බලකායේ වර්ණය වන කොළපැහැති වස්ත්‍රාභරණයෙනි. සිංහ රෙජමේන්තුවේ ද රාගම රණවිරු සෙවනේ ද සහාය මෙහිදී නොඅඩුව ලැබුණු බව මේජර් දුෂ්‍යන්ත කෘතඥපූර්වකව පවසයි. නවයුවලගේ නවදිවිය සර්වප්‍රකාරයෙන්ම වාසනාවත් වේවායි ලංකාවිත්ති පුවත්පත සියළු පාඨකයන් හා එක්ව ඉත සිතින් සුබපතයි!